# වෙළෙඳ,වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය
# ජාතික සමුපකාර සංවර්ධන ආයතනය – පොල්ගොල්ල

**(1) .** තනතුරු නාමය :- ජ්‍යෙෂ්ඨ පර්යේෂක (පුරප්පාඩු - 01)

**(2) .** සේවා ගණය :- ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ සේවාවන් (AR-2)

**(3) .** අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II)**

අධ්‍යාපන

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, කළමනාකරණය, වාණිජ්‍යය, නීතිය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, සංවර්ධන අධ්‍යයනය, ග්‍රාමීය සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශේෂවේදී උපාධියක්

**සමඟ**

ඉහත ක්ෂේත්‍රයකට අදාලව වසර දෙක (02)කට නොඅඩු පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අධ්‍යයන හා පුහුණු ආයතනයක අවම වශයෙන් පර්යේෂණ ක්ෂේත්‍රයේ වසර අට (08)ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, කළමණාකරණය, වාණිජ්‍යය, නීතිය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, සංවර්ධන අධ්‍යයනය, ග්‍රාමීය සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශේෂවේදී උපාධියක්

**සමඟ**

අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PHD) ලබා තිබීම.

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අධ්‍යයන හා පුහුණු ආයතනයක අවම වශයෙන් පර්යේෂණ ක්ෂේත්‍රයේ වසර පහ (05)ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකරණය, කළමණාකරණය, වාණිජ්‍යය, නීතිය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, සංවර්ධන අධ්‍යයනය, ග්‍රාමීය සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් විශේෂවේදී උපාධියක්

**සමඟ**

ඉහත ක්ෂේත්‍රයකට අදාලව වසර දෙක (02)කට නොඅඩු පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ සේවා ගණයේ ( AR -1) පර්යේෂක තනතුරෙහි අවම වශයෙන් වසර අටක (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(4) .**වයස

අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(5) .**වැටුප් ක්‍රමය

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය:

AR -2 - 2025 රු.133,220-10X3,600-169,220/=

**තනතුරට පැවරෙන කාර්යයන්**

- අධ්‍යයන හා සංවර්ධන අංශයේ ප්‍රධානියාගේ මඟපෙන්වීම අනුව ආංශික සැළසුම් සකස් කිරීම හා තම අංශය කළමනාකරණය කරගැනීම.
- පර්යේෂණ හා උපදේශන වැඩසටහන් නිර්මාණය කිරීම, සම්බන්ධීකරණය, සමාලෝචනය හා ප්‍රගතිය ඇගයීමට අදාල කටයුතු සාර්ථකව නිම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
- සුදුසු පරිදි පර්යේෂණ/ සමීක්ෂණ නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- පර්යේෂණ ලිපි ප්‍රකාශයට පත් කිරීම, ප්‍රකාශයට පත් කරන ලද වර්තමාන ගැටළු සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සැලසුම් කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සමුළු පැවැත්වීමේදී ඉහළ සංවිධානාත්මක මට්ටමක් තහවුරු කර ගැනීමට කටයුතු කිරීම.
- රාජ්‍ය හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය සහ සහායයන් ලබා ගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික උපදේශකත්වය සැපයීම.
- සමුපකාර ක්ෂේත්‍රයේ කළමනාකරණ සංවර්ධනය සඳහා තම අංශය සතු භෞතික හා මානව සම්පත් කළමනාකරණය කර ගැනීම.

**(7). බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ප්‍රතිඵල මත තෝරා ගනු ලැබේ.

**(8). ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ ක්‍රමය**

| | | | |
|---|---|---|---|
| I | අධ්‍යාපන සුදුසුකම්(මූලික සුදුසුකම්වලට අතිරේක) | - ලකුණු | 30 |
| II | පර්යේෂණ පළපුරුද්ද | - ලකුණු | 10 |
| III | ප්‍රකාශන,පේටන්ට් බලපත්‍ර සහ ප්‍රදානයන් | - ලකුණු | 20 |
| IV | විෂය බාහිර ක්‍රියාකාරකම් | - ලකුණු | 10 |
| V | පෞරුෂත්වය | - ලකුණු | 15 |
| VI | අදාල ක්ෂේත්‍රය පිළිබඳ සාමාන්‍ය දැනුම | - ලකුණු | 15 |
| | | **ලකුණු** | **100** |

අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරි (රා/ආ)
ජාතික සමුපකාර සංවර්ධන ආයතනය
පොල්ගොල්ල
2026.08.09